**කල්මුනේ මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තම්බර් 09 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 29 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කල්මුනේ මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියුතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ලෙජරය අනුව සමාලොචිත වර්ෂය අවසානයට ආපසු ගෙවියයුතු තැන්පතු වල වටිනාකම රු. 18,078,640 ක් ලෙස දක්වා තිබුණද, සභාව විසින් ඉදිරිපත්කර තිබූ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත තැන්පතු රු. 24,554,249 ක් ලෙස වෙන්වා තිබීමෙන් ආපසු ගෙවිය යුතු තැන්පතු රු. 6,475,609 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණය, කාර්යාල උපකරණ සහ ලී බඩු සහ සවි කිරීම් පිළිවෙලින් රු. 3,432,130 , රු. 5,444,300 සහ රු. 1,641,340 ක මුදලට මිලදී ගෙන තිබුණි ද, මූල්‍ය ප්‍රකාශනවල එහි මිලදී ගත් වටිනාකම ලෙස පිළිවලින් රු. 29,304,324 , රු. 6,341,312 සහ රු. 1,728,410 ක් ලෙස පෙන්වා තිබීමෙන් මුළු එකතුව රු. 26,856,276 කින් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 7,301,700 ක් ලෙස දක්වා තිබුණද එය ගිණුම් ප්‍රකාශනවල රු. 8,632,563 ක් ලෙස දක්වා තිබීම නිසා රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුමේ හිග මුදල රු. 1,330,863 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 89,430,210 | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 26,364,290 | ස්ථාවර වත්කම් ලේඛනය, වත්තම් සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු සහ සවිකිරීම් | 1,623,540 | |
| කාර්යාලීය උපකරණ | 1,586,984 | |

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) අංක බිඑෆ්/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාහන සඳහා රක්ෂණ, ජාතික රක්ෂණ භාරකාර අරමුදලෙන් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ භාරකාර අරමුදලින් පමණක් ලබා ගතයුතු බව සඳහන් කර ඇතත් එයට පටහැනිව වාහන සඳහා රක්ෂණ ආවරණයක් රු. 66,820 ක මුදලක් ගෙවා පුද්ගලික රක්ෂණ ආයතනයකින් ලබාගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxviii පරිච්ඡේදයේ 1.3 වගන්තිය | යොමුගත වධිවිධාන අනුව සෑම නිලධාරියෙකුම තමන්ගේ පැමිණීම සනාථ කිරීම සඳහා පැමිණීමේ ලේඛනයේ අත්සන් |

| | |
|---|---|
| | කළ යුතුය. එසේ වුවද සභාවේ සේවයකළ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු අත්සන් තබා තමාගේ පැමිණීම සනාථ නොකර වසර 3 ක කාලය සඳහා වැටුප් සහ සියළුම දීමනා වශයෙන් එකතුව රු. 1,282,487 ක මුදලක් ලබා ගෙන තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 396(ඩී) | නිකුත්කර මාස හයක් ඉක්මවූ මුදල් නොකළ එකතුව රු. 9,580 ක් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් අදාල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

1.3.5 ප්‍රමාණවත් අධිකාරි බලයෙන් සහතික නොවූ ගනුදෙනු

----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අක්කරේපත්තුවේ මාධ්‍යවේදින්ගේ සම්මේලනයට පරිගණයක් මිලදී ගැනීම සඳහා සභාවේ අනුමැතියකින් තොරව රු. 58,000 ක් සහ මරුතමුනේ අල් මනාර් මධ්‍ය මහ විදුහලේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. 98,010 ක් වැය කර තිබුණි.

(ආ) මහ නගර සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි වී ඇති ක්‍රිඩා සමිති සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීමේ අදහසින් සමාලෝචිත වර්ෂයේදී රු. 2,000,000 ක මුදලක් අයවැය ප්‍රතිපාදනය සලසා තිබුණි. එම අරමුණ සඳහා රු. 2,240,269 ක මුදලක් වැයකර තිබුහෙයින් වැඩිපුර වැයවූ රු. 240,269 ක් මුදල සඳහා සභාවේ අනුමැතිය ලබා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2,190,353 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 9,413,149 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,222,796 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 මුද්දර ගාස්තු

---------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 2,518,644 ක මුදල රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් අයකර ගැනීම සඳහා අදාල අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ හෙයින් සභා බල ප්‍රදේශයතුල පෞද්ගලික විදුලි සංදේශ අයතනවලින් ස්ථාපිත කරනු ලද විදුලි සංදේශ කුළුණු 24 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවියයුතු රු. 72,000 ක බලපත්‍ර ගාස්තු ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ආ) 1982 සිට 2012 දක්වාවූ කාල පරිච්ඡේදයට අයත් හිගව පවතින, මේ දක්වා අයකර නොමැති රු. 537,386 ක මස්කඩ බදු මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට 2014 ඔක්තොම්බර් 02 දින දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකරගත් එකතුකල අගය මත බදු මුදල වන රු. 1,261,703 ක් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වෙතට ප්‍රේෂණය කිරීමට විගණන දිනය වන 2014 ඔක්තෝබර් 02 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මස්කඩ බදු ගත් බදුකරුවන් තුන් දෙනෙකුගෙන් ඇප මුදල් වශයෙන් ලැබී තිබූ රු. 460,699 ක් වටිනා චෙක්පත් 04 ක් බැංකුවේ තැන්පත් කිරීමෙන් පසු අගරුවී තිබුණි. මෙසේ අගරුවූ චෙක්පත් වෙනුවෙන් අදාල බදුකරුවන්ගෙන් මුදල් අයකර ගැනීමට හෝ ඔවුන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට 2014 ඔක්තෝබර් 02 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) මහ නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ලැප්ටොප් පරිගණකයක් රු. 85,000 මුදලකට මිලදී ගෙන රාජකාරි කටයුතු සඳහා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුට භාරදී තිබුණි. 2014 අප්‍රේල් 30 වන දින එම නිලධාරියා ස්ථාන මාරුවීගොස් තිබුනද එම ලැප්ටොප් පරිඝනකය නැවත ලබා ගැනීම සඳහා 2014 ඔක්තෝබර් 02 දින දක්වා මහ නගර සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අයවැය ලේඛනයෙන් අනුමතකර තිබූ වැය විෂයන් 51 කට අදාලව වෙන්කර තිබූ මුදල් ප්‍රමාණයට වඩා එකතුව රු. 7,796,594 ක් සඳහා පරිපූරක අනුමැතිය ලබා ගැනීමකින් තොරව වැය කර තිබුණි.

(ඉ) කාර්යාලය පිහිටා තිබෙන ස්ථානයන් පෙන්වන පුවරුවක් සකස්කර සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයෙදී රු. 123,000 ක මුදලක් ගෙවීම් කර තිබුණද 2014 ඔක්තෝබර් 02 දින පවත්වන ලද විගණනයේදී එවැනි පුවරුවක් මහ නගර සභාවේ සවිකර නොතිබුණු බව නිරීක්ෂනය විය.

3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ළමා උද්‍යානය, වාහන ගරාජය සහ ගව සාතකාගාරය යන ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබා ගැනීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත සමාලෝචිත වර්ෂයේදී සභා අනුමැතියකින් තොරව රු. 145,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වූවද එම ආයතනයන් අදාල වාර්තාව 2014 ඔක්තෝබර් 02 දින දක්වා ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයෙදී මහ නගර සභා අරමුදලින් ලැප්ටොප් පරිඝණකය, ප්‍රින්ටරය සහ ස්කැනරය යනාදිය රු. 100,000 ක මුදලකට මිලදිගෙන කල්මුණෙ පිහිටි තරුණ සමිතියකට ලබාදී ස්කැනරය ඇති බව දක්වා තිබුණ ද අදාල තරුණ සමිතියට 2014 ඔක්තෝබර් 02 වන දින දක්වාත් එම ලැප්ටොප් පරිඝණකය, ප්‍රින්ටරය සහ ස්කැනර් යන්ත්‍රය භාර දී නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බවට වු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම